# 6 පරිච්ඡේදය


# ශ්‍රී ලංකාවේ ජනාවාස

ජනාවාස යනු මොනවාදැයි පස් වැනි පරිච්ඡේදයෙන් ඔබ ඉගෙන ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ජනාවාසවල වර්ධනය පිළිබඳ ව මෙම පරිච්ඡේදයෙන් අධ්‍යයනය කෙරේ.

## 6.1 ජනාවාස වර්ධනය

ක්‍රිස්තු පූර්ව 1000ට ප්‍රථම ස්වාභාවික පරිසරය මත ම යැපුණ මිනිසා ආහාර රැස් කිරීම ජීවිතයේ මූලික කාර්යය කර ගත්තේ ය. ආහාර සෙවීම සඳහා බොහෝ දුර ගමන් කළ ඔහු අව්වෙන් වැස්සෙන් ආරක්ෂා වීම සඳහා පරිසරයෙන් ම සොයා ගත් ගස්බෙන, ගල්ගුහාවල ජීවත් විය. ක්‍රි.පූ. 300 පමණ වන විට ඔවුහු ගොවිතැන් කිරීමට හුරු වූහ. එය ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනාවාසවල ආරම්භය යි.

ආර්යයන් පැමිණීමෙන් පසු ශ්‍රී ලංකාවේ ජනාවාස තවදුරටත් වර්ධනය විය. මෙහි දී වී ගොවිතැන සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීමේ පහසුව මත ගංගා ආශ්‍රිත ව ජනාවාස බිහි වීම සිදු විය.




6.1 සිතියම: ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාසවල ව්‍යාප්තිය

මූලාශ්‍රය: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1999, සමාජ අධ්‍යයනය හා ඉතිහාසය 10 ශ්‍රේණිය

**ආර්යයන්ගේ පැමිණීමෙන් පසු ඇති වූ ජනාවාස**

| ගංගාව | ජනාවාස |
|---|---|
| මල්වතු ඔය | අනුරාධගාම, උපතිස්සගාම |
| කලාඔය | උරුවෙලගාම |
| කැලණි ගඟ | කල්‍යාණි |
| කිරිඳි ඔය | මහාගාම |
| මැණික් ගඟ | කාචරගාම |
| ගල් ඔය | දීඝවාපි |

මුල් යුගයේ ග්‍රාමීය ජනාවාසයක නිවාස, වැව, කුඹුරුයාය, ගොඩ ඉඩම්, තණබිම්, කැලෑව වැනි අංග තිබිණි. උස් බිම් කොටස, නිවාස, ගෙවතු හා හේන් සඳහා වෙන් විය. ස්වයංපෝෂිත ලක්ෂණ දක්නට ලැබුණු මෙවැනි ජනාවාසයක වී ගොවිතැන ආශ්‍රයෙන් ප්‍රධාන ආහාරය සපයා ගන්නා ලදි. සහල් වෙනුවට ආදේශන බෝග වන කුරක්කන්, මෙනේරි, අමු වැනි වගාවන් හේන්වල ද එළවළු හා පලතුරු ගස් කීපයක් ගෙවතුවල ද තිබිණි. පොහොර සහ කිරි ලබා ගැනීම සඳහා ගෙවතුවල ගවයින් කීපදෙනෙක් සිටීමත් මෙම ජනාවාසවල විශේෂත්වයක් විය.

ක්‍රි.ව. ආරම්භය වන විට පාලන කේන්ද්‍රය ලෙස තෝරා ගත් නගර වර්ධනය වීම සිදු විය. පණ්ඩුකාභය රජතුමා අනුරාධපුර නගරය නාගරික ලක්ෂණ සහිත ව සකස් කොට ඇත. නිවාස, ජලය බැස යන කානු පද්ධති, වැසිකිළි, සුසාන භූමි, උයන්, පොකුණු, රජ මාළිගය ප්‍රධාන නාගරික ලක්ෂණ අතර වැදගත් වේ. පසුකාලීන ව පොළොන්නරුව ද නාගරික ලක්ෂණ සහිත ව නිර්මාණය කොට ඇත. විශාල වාරි මාර්ග පද්ධති ඉදි වූ මෙකල කෘෂිකාර්මික වශයෙන් සංවර්ධනයක් ඇති විය. එපමණක් නොව අග්‍රගණයේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ වන පිළිම නෙළීම, ගල් කණු, මුරගල්, කැටයම් ආදිය නිර්මාණයේ යෙදුනු බවට සාක්ෂි අනුරාධපුරය, පොළොන්නරුව වැනි පාලන කේන්ද්‍ර ආශ්‍රයෙන් හඳුනා ගත හැකි ය.

අනුරාධපුර, පොළොන්නරු යුගවල නිෂ්පාදන අතිරික්තයක් ඇති වීමත්, විදේශ වෙළෙඳ සම්බන්ධතා වර්ධනය වීමත් නිසා ගෝකණ්ණ, ජම්බුකෝල පට්ටන, මාන්තායි, තම්බපන්නි ආදි වෙළෙඳ තොටුපළ ඇති වීමත් දක්නට ලැබේ.

පරසතුරු ආක්‍රමණ, වාරිමාර්ග විනාශ වීම, ජල ප්‍රශ්නය සහ මැලේරියා වැනි වසංගත බෝවීම ආදී හේතූන් නිසා ජනයා විශාල වශයෙන් වියළි කලාපයෙන් තෙත් කලාපය ට සංක්‍රමණය වන්නට විය. ඒ අනුව රාජධානිය ද තෙත් කලාපයට මාරු විය. දඹදෙනිය, යාපහුව, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ වැනි පාලන කේන්ද්‍රවල නාගරික ලක්ෂණ ඒ ඒ යුගවල ඇති විය. වියළි කලාපයේ වී ගොවිතැන් මුල් කොට ගත් කෘෂිකර්මයට වඩා වෙනස් බෝග වර්ග තෙත් කලාපයේ දක්නට ලැබිණි. වැව කේන්ද්‍ර කොටගත් ජනාවාස රටාව තෙත් කලාපය තුළ ජනාවාස වීමේ දී දක්නට නො ලැබුණි.


ක්‍රි.ව. 1500න් පසු යුරෝපා ජාතීන්ගේ ආගමනයත් සමග ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික වශයෙන් විශාල වෙනස්කම් සිදු විය.

ඉංග්‍රීසින් ඇති කළ මුඩුබිම් පනත මගින් ඉඩම් අහිමි වූ පිරිසක් ඇති විය. මෙකල රජයට අත් කර ගෙන පසුව වැවිලිකරුවන්ට වෙන්දේසි කළ ඉඩම්වල වතු බෝග වගාව ව්‍යාප්ත විය. වතු වගාව ආශ්‍රිත ව රැකියා අවස්ථා ඇති වුවත් සිංහලයන් එම රැකියාවල යෙදීමට අකමැති වූ නිසා ඉන්දියාවෙන් ද්‍රවිඩ ජනයා මෙරටට ගෙන ආ අතර එම කම්කරුවන් සඳහා වතු ජනාවාස ඉදි කරනු ලැබී ය. පහසුකම් නැති එම නිවාස පාරිසරික ගැටලුවක් බවට ද පත් වී ඇත.

වතු ආශ්‍රිත නිෂ්පාදන පිටරටට යැවීමත් පාරිභෝගික භාණ්ඩ ගෙන්වීමත් සඳහා කොළඹ වරාය සංවර්ධනය කරනු ලැබී ය. ස්වයංපෝෂිත ආර්ථික රටාව ගිලිහී යමින් ආනයන අපනයන ආර්ථික රටාවක් බිහි විය. භාණ්ඩ ප්‍රවාහනය සඳහා මාර්ග පද්ධතියක් ඇති විය. මේ අනුව ජනාවාස රටාවල ද වෙනස්කම් සිදු විය. මාර්ග දෙපස රේඛීය ජනාවාස ද විදේශිකයින්ගේ සුබ විහරණය සඳහා නිවාස සුළු ප්‍රමාණයක් ද බිහි වූ අතර කොළඹ, ගාල්ල, මහනුවර ආදී සංකීර්ණ නගර කීපයක් ද ඇති විය.

තෙත් කලාපයේ වර්ධනය වන ජන පීඩනය අවම කිරීම පිණිසත්, යළිත් දේශීය කෘෂි ආර්ථිකය නගා සිටුවීම සඳහාත් වියළි කලාපයේ ගොවි ජනපද ආශ්‍රිත ව නව ජනාවාස ඇති කිරීම ආරම්භ වූයේ බ්‍රිතාන්‍යය පාලන යුගයේ අවසාන භාගයේ සිට ය. වාරි මාර්ග පදනමින් බිහි කළ වියළි කලාපීය ජනපදකරණය නිදහස ලැබීමෙන් පසුව වඩාත් වේගවත් ව ක්‍රියාත්මක කරණු ලැබී ය. උදහරණ ලෙස මින්නේරි ගොවි ජනපදය දැක්විය හැකි ය.

මුල් ගොවි ජනපද ආශ්‍රයෙන් ජනපදිකයන්ට ඇති වූ අපහසුකම් සැලකිල්ලට ගනිමින් මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පොකුරු ජනාවාස හා සේවා මධ්‍යස්ථාන පදනම් කර ගත් නව ජනාවාස රටාවක් බිහි කරනු ලැබී ය. ශ්‍රී ලංකාවේ භූමියෙන් 16%ක් පමණ අයත් වන මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ වියළි කලාපය නැවත ජනාවාස කිරීමේ උච්චතම අවස්ථාව යි. සැලසුම් සහගත භූමි පරිභෝග රටාවකින් සහ පොකුරු ජනාවාස රටාවකින් සමන්විත වූ මහවැලි ජනාවාසවල ආර්ථික තත්ත්වය යහපත් වුවත් පුරාණ ගැමි ජනාවාසවල තරම් පවුල් අතර බැඳීමක් දක්නට නො ලැබුණි.




6.2 සිතියම : ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගොවි ජනපද

මූලාශ්‍රය: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1999, සමාජ අධ්‍යයනය හා ඉතිහාසය 10 ශ්‍රේණිය

නිදහසින් පසු ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේ දී කාර්මික අංශයේ වර්ධනය ද අපේක්ෂා කෙරිණි. මුල් අවධියේ දී මහා පරිමාණ කර්මාන්ත ගැන විශේෂ උනන්දුවක් දක්වනු ලැබී ය. රාජ්‍ය අනුග්‍රහය යටතේ ආරම්භ කරනු ලැබූ සිමෙන්ති, සීනි, රසායනික ද්‍රව්‍ය, තුනීලැලි වැනි කර්මාන්ත දිවයිනේ ග්‍රාමීය ප්‍රදේශවල ස්ථානගත කෙරුණු අතර, මෙවැනි කේන්ද්‍රවලට යටිතල පහසුකම් ඇති කිරීමත්, ජනයා ඇදී ඒමත් සිදු විය. පසුව රජයේ කර්මාන්ත ප්‍රතිපත්තියේ ඇති වූ වෙනස්කම් අනුව සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත දිරිගැන්වීමත්, කාර්මික සංවර්ධනය සඳහා පුද්ගලික අංශය විශාල වශයෙන් සහභාගි කරවා ගැනීමත් දක්නට ලැබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් යටිතල පහසුකම් ඇති ශ්‍රමය අවශ්‍ය ප්‍රදේශවලට ජනයා ඇදී එන්නට විය. මේ අනුව ශ්‍රී ලංකාවේ කර්මාන්තවලින් 80%කට වඩා ව්‍යාප්ත ව ඇත්තේ කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවල ය. රැකියා සඳහා නගරයට පැමිණි පිරිස් බොහෝ දුරට පදිංචි වූයේ කොළඹ නගරයට ආසන්න වෙනත් නගර හා උපනගරවල යි. මේ නිසා උප නගර වර්ධනය වීම වේගවත් විය. කොළඹ නගරය වටා පිහිටි වත්තල, පෑලියගොඩ, රාගම, මොරටුව, මහරගම, වැනි උප නගර උදහරණ ලෙස දැක්විය හැකි ය.

ශ්‍රී ලංකාව අධික ජන සංඛ්‍යාවක් ඇති රටකි. ශ්‍රී ලංකාවේ අධික ජන සංඛ්‍යාවක් ව්‍යාප්ත ව ඇත්තේ කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර දිස්ත්‍රික්ක ඇතුළත් කලාපයේ යි. දිස්ත්‍රික්ක අනුව ශ්‍රී ලංකාවේ අධිකතම ජන සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාප්ත ව ඇත. ග්‍රාමීය ජනාවාසවලින් කොළඹට සංක්‍රමණය වන බොහෝ පිරිස් අධික මිල ගණන් ගෙවා නවාතැන් පහසුකම් ලබා ගැනීමට පවතින නොහැකියාව මත පහසුකම් නැති පැල්පත් නිවාස හා මුඩුක්කුවල පදිංචි වී සිටිති. මරදාන, මාලිගාවත්ත, කෙසෙල්වත්ත, අලුත්කඩේ, පංචිකාවත්ත උදහරණ වේ. මෙම මුඩුක්කු හා පැල්පත් වාසීන් සඳහා නිවාස ඉදි කර දීමට නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව හා නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. නිවාස දශ ලක්ෂයේ වැඩසටහන, "පිවිතුරු ජනාවාස ව්‍යාපෘතිය" මෙම ව්‍යාපෘතිවලින් සමහරකි.

අධික ජන සංඛ්‍යාවක් වාසය කරන නගරවල ජන පීඩනය අඩු කිරීම සඳහා වෙනත් සැලසුම්ගත ස්ථානයකට නගරයේ කටයුතු ප්‍රතිව්‍යාප්ත කිරීම අරමුණු කර ගෙන නව නගර ඇති කිරීම, ශ්‍රී ලංකාවේ ජනාවාස වර්ධනයේ නව ප්‍රවණතාවකි. ජන සංඛ්‍යාව අට ලක්ෂයකටත් වඩා වාසය කරන කොළඹ නගරයේ වාණිජ, මූල්‍ය, අධ්‍යාපනික, සෞඛ්‍යය වැනි කාර්යයන් රාශියක් සංකේන්ද්‍රණය වී ඇත. දිනපතා විවිධ අවශ්‍යතා සඳහා මිලියනයකට වඩා අධික ජන සංඛ්‍යාවක් කොළඹ නගරයට පැමිණේ. කොළඹ නගරයේ පවතින ජන පීඩනය හා අධික කාර්යභාරය නිසා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව නගරයේ පරිපාලන කටයුතු ද කොළඹ නගරයේ වෙළෙඳ කටයුතු ද කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව පාර්ලිමේන්තුව, සෙත්සිරිපාය, ඉසුරුපාය වැනි රජයේ කාර්යාල පිහිටි ගොඩනැගිලි සංකීර්ණ ද කෝට්ටේ නව නගරය ආශ්‍රිත ව ස්ථානගත කර ඇති අතර තවත් දෙපාර්තමේන්තු 80ක් ජයවර්ධනපුර කෝට්ටේ නව නගරයේ පිහිටුවීමට අපේක්ෂිත ය. අනුරාධපුර නව නගරය ද උඩවලව ආශ්‍රිත ව ඇඹිලිපිටිය නවනගරය ද මෙලෙස ඉදි කළ නව නගරවලට උදහරණ වේ.

**ක්‍රියාකාරකම්:**

1. මුල් යුගයේ ජනාවාස ඇති කිරීමට බලපෑ භෞතික කරුණු දෙකක් ලියන්න.
2. වියළි කලාපයෙන් තෙත් කලාපයට ජනාවාස සංක්‍රමණය වීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න.
3. තෙත් කලාපය, වියළි කලාපය, ගල්ඔය ජලාශය, මහවැලි ගඟ, වික්ටෝරියා ජලාශය, කොත්මලේ ජලාශය, අනුරාධපුරය, පොළොන්නරුව, දඹදෙනිය, කුරුණෑගල, යාපහුව, මහනුවර, ගම්පොල, ජයවර්ධනපුර කෝට්ටේ, කොළඹ, මොරටුව, ගාල්ල, මාතර, කළුතර ශ්‍රී ලංකාවේ සිතියමක ලකුණු කර නම් කරන්න.
4. ඔබගේ නිවස පිහිටි නගරයේ හෝ ගමේ මුල් පදිංචිකරුවන් හමු වී ඔවුන්ගෙන් ලබා ගත් තොරතුරු අනුව මෙම වගුව පුරවන්න.

| පදිංචි වූ වර්ෂය | එකල සිටි පවුල් ගණන | එකල තිබූ ගොඩනැගිලි | වර්තමාන තත්ත්වය පිළිබඳ ඔබගේ අදහස |
|---|---|---|---|
| | | | |

5. ඔබ පදිංචි ප්‍රදේශයේ ගම්මානයක් ඇසුරු කර ගෙන ඔබ ඉගෙන ගත් පුරාණ ගම්මානයක ලක්ෂණ සැසඳෙන ආකාරයෙන් මෙම වගුව පුරවන්න.


| | පුරාණගම ඇත/නැත | වර්තමාන ගම ඇත/නැත |
|---|---|---|
| වැවක් පිහිටා තිබීම | | |
| විහාරස්ථානයක් පිහිටීම | | |
| කුඹුරු පිහිටීම | | |
| පාසලක් තිබීම | | |
| භාණ්ඩ හුවමාරු ක්‍රමය තිබීම | | |
| වෙළෙඳ සැල් පිහිටා තිබීම | | |
| නගරයට සම්බන්ධ මාර්ග පිහිටා තිබීම | | |
| හේන් පිහිටා තිබීම | | |
| පලතුරු හා එළවළු වගාව | | |

6. I. ඔබ වාසය කරන ජනාවාසය අයත් වන්නේ මින් කුමන වර්ගයට ද? ග්‍රාමීය/ගැමිරික/නාගරික
   II. ඊට හේතු 3ක් ලියන්න

7. I. ඔබ ජීවත් වන ප්‍රදේශයේ වත්මන් තත්ත්වය හා අතීත තත්ත්වය පිළිබඳ තොරතුරු සොයා ලිපියක් සකස් කරන්න.
   II. ඔබ පදිංචි ව සිටින ප්‍රදේශය වටා පිහිටි ගම්මාන පහක් ද නගර පහක් ද ගැමිරික කලාපයේ ඇති කුඩා සේවා මධ්‍යස්ථාන දෙකක් ද නම් කරන්න.

## 6.2 ශ්‍රී ලංකාවේ ජනාවාස රටාවන්

ජනාවාස ඇති වූ ආකාරය හෙවත් ප්‍රභවය, ජනාවාසයක විශාලත්වය, බිම් සැලැස්ම, කාර්යය, ප්‍රධාන ආර්ථික කටයුතු යන කරුණු විමසා බලන විට ශ්‍රී ලංකාවේ ජනාවාසවල විවිධත්වයක් ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ ජනාවාස වර්ග පිළිබඳ තොරතුරු හඳුනා ගත හැකි ය.




### කුඩා ගම්

ශ්‍රී ලංකාවේ ජනාවාස රටාවන් අතර අඩු ජන සංඛ්‍යාවක් ව්‍යාප්ත වූ ජනාවාස වර්ගයක් ලෙස "කුඩාගම" හඳුන්වා දිය හැකි ය. කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන ජන කණ්ඩායම් "කුඩාගම්" ජනාවාසවල ජීවත් වෙති. කෘෂිකාර්මික කටයුතු අතර වී ගොවිතැන හා කුරක්කන්, මෙනේරි වැනි ධාන්‍ය වගාවන් ද වැදගත් ය. කොත්මලේ ජලාශය තැනීමේ දී හා නායයාම්වල දී අවතැන් වූ ජනතාව සඳහා කොත්මලේ කඳු බෑවුම්වල ඉදි කළ රිවර්සයිඩ්, මොරගොල්ල වැනි ගම්මාන ද කුඩා ගම්මාන ලෙස හැඳින්විය හැකි ය.

### වැව් ජනාවාස

වියළි කලාපයේ වැව් ආශ්‍රිත ව ඇති වූ ජනාවාස වර්ගයකි. වැව් ජලය ආශ්‍රයෙන් වී ගොවිතැන් කිරීම මූලික ආර්ථික කටයුත්ත වන අතර මුං, කුරක්කන් වැනි හේන් බෝග වගාව ද ගෙවත්තේ පලතුරු හා එළවළු වගාව ද කෙරේ. වැව් මාළු සහ කැලයෙන් දඩයම් කළ මස් පවුල් අතර බෙදා ගෙන සහයෝගයෙන් අනුභව කළහ. ජනාවාසයක මූලික ලක්ෂණ




6.1 රූපය : වැව් ජනාවාසයක්

ලෙස කුඹුරු යාය, වැව, වනාන්තර, හේන් බිම් හා ගම්ගොඩ හැඳින්විය හැකි ය. බොහෝ දුරට මෙවැනි ජනාවාසවල ස්වයංපෝෂිත ලක්ෂණ තිබිණි.

## රේඛීය ජනාවාස

පුරාණ වැව් ගම්මානවල නිවාස පිහිටා තිබුණේ ඒකරාශී වූ පොකුරු ආකාරයට ය. කල් ගතවත් ම මෙම ජනාවාස එකිනෙක අතරත් ජනාවාස හා නගර අතරත් සම්බන්ධතා වර්ධනය විය. ඒ අනුව මං මාවත් ඇති වූ අතර පසු කාලයේ දී ඒවා සංවර්ධනය කිරීම ද සිදු විය. එක් රැස් ව සිටි ජනයා මාර්ග අසල නිවාස ඉදි කිරීමෙන් මෙතෙක් ඒකරාශි ව තිබූ ජනාවාස ක්‍රමය වෙනුවට රේඛීය ව පැතුරුණු ජනාවාස ව්‍යාප්ත විය.



6.2 රූපය : රේඛීය ජනාවාසයක්

රේඛීය ජනාවාස මහා මාර්ග, ඇළ මාර්ග, ඔස්සේ විහිදී ඇත. තව ද වෙරළ තීරුවල මුහුදු ආශ්‍රිත ධීවර කටයුතු සඳහා රේඛීය ව විහිදුණු ජනාවාස බිහි වී ඇත. මුල් යුගයේ වියළි කලාපයේ ගොවි ජනපද ඇති කිරීමේ දී අනුගමනය කළේ රේඛීය ආකාරයට විහිදුණු ජනාවාස රටාවකි. උදාහරණ ලෙස කාගම, කන්තලේ ගොවි ජනපද පෙන්වා දිය හැකි ය.

## මහවැලි පොකුරු ජනාවාස



6.3 රූපයः පොකුරු ජනාවාසයක්

මුල් අවධිවල වියළි කලාපයේ ජනපද ඇති කිරීමේ දී අනුගමනය කළ රේඛීය ජනාවාස ක්‍රමය මඟින් නිවෙස්වලට සම්පත් බෙදා හැරීම පිළිබඳ ගැටලු ඇති වී තිබේ. එමෙන් ම ජනාවාසයක සහයෝගය, පවුල් අතර බැඳීම වර්ධනය නොවූ අතර රේඛීය ජනාවාස ක්‍රමයෙන් මෙම තත්ත්වය තවදුරටත් තහවුරු විය. එයට විසඳුමක් ලෙස මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ ජනාවාස ඉදි කිරීමේ දී පොකුරු ජනාවාස ක්‍රමය අනුගමනය කරනු ලැබී ය. මෙහි දී අක්කර භාගයක් වැනි බිම් කොටසක ඉදි කළ නිවෙස් එකිනෙකට ආසන්න ව ඉදි කළ අතර කුඹුරු වගා බිම් ජනාවාසයෙන් පිටත දක්නට ලැබුණි. මෙම

ක්‍රමය මඟින් ගොවීන්ට සේවා සැපයීමට පහසුවක් ඇති වූ අතර පවුල් අතර බැඳීමක් ඇති කිරීමට ද ඉවහල් විය. ගොවිතැන් කටයුතුවල දී සාමූහිකත්වයෙන් වැඩ කිරීමට මෙය අනුබලයක් විය.

## වතු ජනාවාස



6.4 රූපය : වතු ජනාවාසයක්

බ්‍රිතාන්‍ය ජාතිකයෝ ශ්‍රී ලංකාව යටත් කර ගත් පසුව ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශවල මුල දී කෝපි වගාවත් එය අභාවයට යාමෙන් පසු ව තේ වගාවත් ඇති කළහ. මෙම වතුවල වැඩ කිරීමට සිංහල ජාතිකයින් අකැමති වූ නිසා ඉන්දියාවෙන් ද්‍රවිඩ කම්කරුවෝ මෙරටට ගෙන්වන ලදහ. මෙම කම්කරුවන් උදෙසා තනි කාමර සහිත නිවෙස් පේළි ඉදිකර ඇත. මෙම ජනාවාස ඉතා අඩු පහසුකම් සහිත ය. මෙවැනි ජනාවාස ආශ්‍රිත ව පාසලක්, හින්දු කෝවිලක් ආදිය දක්නට ලැබුණි. මේවා බහුල ලෙස පිහිටා ඇත්තේ බදුල්ල, නුවරඑළිය, රත්නපුරය, කෑගල්ල, මාතලේ ආදී දිස්ත්‍රික්කවල ය.

## ධීවර ජනාවාස

ඉන්දියන් සාගරයේ දූපතක් වන ශ්‍රී ලංකාව වටා ඇති මුහුදු ප්‍රදේශය කරදිය ධීවර කර්මාන්තයට මහත් පිහිටුවහලකි. ශ්‍රී ලංකාව වටා ධීවර වරායන් රාශියක් පිහිටා ඇත. මීගමුව, හලාවත, ගාල්ල, මිරිස්ස, තංගල්ල, පේසාලෙයි, කල්මුනේ, මන්නාරම, ත්‍රිකුණාමලය, කල්පිටිය ආදී ධීවර වරායන් අශ්‍රිත ව විශාල වශයෙන් ධීවරයෝ පදිංචි ව සිටිති. වාරකන් කාල සීමාවේ දී බොහෝ ධීවරයෝ



6.5 රූපය : ධීවර ජනාවාසයක්

වෙනත් දිශාවකට ගොස් මාලු ඇල්ලීමේ කටයුතුවල යෙදෙන බැවින් ධීවර නිවෙස්වලින් වැඩි කොටසක් පැල්පත් ලෙස පවතී. 2004 වර්ෂයේ සුනාමි බලපෑම හේතුවෙන් බොහෝ ධීවර ජනාවාසවලට තදබල පහරක් එල්ල විය.

## කාර්මික ජනපද

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටකි. මෙරට කාර්මික සංවර්ධනයක් ඇති කිරීමට බොහෝ රජයයන් උත්සාහ ගෙන ඇත. ඒ අනුව දේශීය කර්මාන්තකරුවන් නගා සිටුවීමේ පරමාර්ථයෙන් කාර්මික ජනපද ඇති කර තිබේ. පල්ලේකැලේ, ඒකළ, අච්චුවේලී එවැනි කාර්මික ජනපදවලට උදාහරණයන් ය. කාලයක් ගත වීමේ දී මෙම ජනාවාසවල කර්මාන්ත ආරම්භ කරන්නන් දියුණුවට පත් වී තම කර්මාන්තය ඉඩ පහසුකම් තිබෙන ස්ථානයකට ගෙන යාම සිදු වේ. එය ශ්‍රී ලංකාවේ කාර්මික දියුණුවට ඉවහල් වෙයි. විශේෂයෙන් තනිව නැගී සිටීමට නො හැකි කර්මාන්ත හිමියන් නගා සිටුවීම මෙහි පරමාර්ථය යි. කාර්මික පුහුණුවක් ලබා දීමේ වැඩසටහන් ද මෙම කාර්මික ජනපද ආශ්‍රිත ව සිදු කෙරේ.

## කර්මාන්ත පුරය

දේශීය කර්මාන්ත අංශය පුළුල් කිරීමේ හා රැකියා අවස්ථා ඇති කිරීමේ අරමුණින් කර්මාන්ත පුර ඇති කර තිබේ. කුඩා පරිමාණ කර්මාන්ත මෙන් ම මධ්‍යම පරිමාණ කර්මාන්ත ද කර්මාන්ත පුරයක දක්නට හැකි ය. මෙහි දී එක ම කලාපයක් තුළ විවිධ කර්මාන්ත ස්ථානගත වීම සිදු වේ. කර්මාන්ත පුරයක අලංකාර මැටි භාණ්ඩ නිෂ්පාදනය, පැදුරු, කලාල, කොහු නිෂ්පාදන, පිත්තල භාණ්ඩ, මැණික් කැපීම, ස්වර්ණාභරණ කර්මාන්ත සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම, ණය පහසුකම් ලබා දීම, අමුද්‍රව්‍ය ලබා දීම, අපනයන පහසුකම් ලබා දීම, ආදී ක්‍රියාමාර්ග මඟින් කර්මාන්ත හිමියන් දිරි ගන්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ කාර්මික දියුණුව සඳහා මෙලෙස කර්මාන්ත හිමියන් ව්‍යාප්ත කිරීම ඵලදායී කටයුත්තක් වේ. රෙදි මුද්‍රණය, ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය, ඇඟලුම් කර්මාන්තය ආදී විවිධ වර්ගයේ කර්මාන්ත, කර්මාන්ත පුරයක ස්ථානගත විය හැකි ය.

එමෙන්ම මෙම කර්මාන්තවල සේවය කරන්නන් එම ප්‍රදේශවල ම පදිංචි ව සිටින නිසා නගර කරා ජනයා සංක්‍රමණය වීම වැළකෙන අතර නගරයෙන් බැහැර ප්‍රදේශවල ද කර්මාන්ත දියුණුවට මෙමඟින් ඉඩ සැලසේ. ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් එක්රැස් කර මහනුවර දිස්ත්‍රික්කයේ නත්තරන්පොත කර්මාන්ත පුරයක් ඇති කර ඉඩම් ලබා දීමෙනුත් නිෂ්පාදන අපනයනය කිරීමට පහසුකම් ලබා දීමෙනුත් ණය සහ රජයේ අනුග්‍රහය ලබා දීමෙනුත් උපකාරී වීම උදාහරණයන් වශයෙන් දැක්විය හැකි ය.

## 6.3 ශ්‍රී ලංකාවේ ජනාවාසවල වෙනස් වීම්



6.6 රූපයඃ කොළඹ නගර මධ්‍යයේ දර්ශනයක්

මෑත යුගයේ නගරවල ඇති වූ වර්ධනය ශ්‍රී ලංකාවේ ජනාවාසවල කැපී පෙනෙන ලක්ෂණයකි. නගරවල මාර්ග, විදුලි බලය, දුරකථන වැනි යටිතල පහසුකම් වර්ධනය වීම ශීඝ්‍රයෙන් සිදු විය. එමෙන්ම වරාය, ගුවන්තොටුපළ වැනි සේවාවන් ද ඇති වීම නිසා කොළඹ නගරය ආශ්‍රිත ව පෞද්ගලික අංශයේ කර්මාන්ත වැඩි වශයෙන් ස්ථානගත විය. රැකියා සඳහා පැමිණි ජනයාගෙන් කොළඹ නගරයේ ජනසංඛ්‍යාව විශාල වශයෙන් වැඩි විය. එමෙන් ම නාගරික ප්‍රදේශවල තිබූ කෘෂිකාර්මික භූමි පරිභෝගයන් අඩු වූ අතර වාණිජ භූමි පරිභෝගයන් වඩාත් ප්‍රචලිත විය.

නගරවල විවිධ රැකියා සඳහා නගරයෙන් බැහැර ප්‍රදේශවල ජනයාගේ පැමිණීම නිසා දෛනික සචලතාව වැඩි විය. කල්ගතවත් ම නගරයට පැමිණෙන පිරිස් අධික වශයෙන් නගරවල පදිංචි වීම නිසා නගරවල ඉඩම් මිල ඉහළ යාම සිදු විය. නගර ආශ්‍රිත ව නිවාස හිඟයක් ඇති වූ අතර එයට විසඳුමක් ලෙස නගරවල තට්ටු නිවාස ඉදි කරනු ලැබී ය.

නගර වර්ධනය වීමත් සමඟ නගර කරා පැමිණෙන ජනතාවට පදිංචි වීම සඳහා නිවාස මිලදී ගැනීමට ඉතා අධික මුදලක් වැය කිරීමට සිදු වීමත්, ඉඩම් හිඟ වීමත් නිසා බොහෝ ජනයා අඩු පහසුකම් සහිත මුඩුක්කු හා පැල්පත් නිවාසවල පදිංචි වූහ. මෙම නිවාස පාරිසරික, සංස්කෘතික, සමාජයීය හා ආර්ථික ගැටලු රැසකට මුල් විය. මෙම ගැටලුවලට විසඳුමක් ලෙස අලුතින් නිවාස ඉදි කර දීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. උදාහරණයක් ලෙස කොළඹ නගර සභා ප්‍රදේශයේ වනාතමුල්ල නිවාස යෝජනා ක්‍රමය මඟින් පැල්පත් වාසීන්ට නොමිලේ නිවාස සපයා දී තිබේ. එම නිවාස වෙනත් අයකුට විකිණීමට නොහැකි ලෙස පවරා දී තිබීම ද විශේෂ ලක්ෂණයකි.




6.7 රූපය : නගරයේ පැල්පත් නිවාස

ප්‍රධාන නගරයේ තදබදය වැඩිවත් ම එහි ඉඩම් සීමිත වීම හා මිල ඉහළ යාම නිසා බොහෝ ජනයා නගරයට ආසන්න ප්‍රදේශවල පදිංචි වූහ. නගරය වටා අධික වශයෙන් ජනතාව පදිංචි වීමේ දී එම ප්‍රදේශවලට ද මහාමාර්ග, විදුලිය, දුරකථන වැනි යටිතල පහසුකම් ඇති විය. මෙම ප්‍රදේශවල නගරයට වඩා ඉඩම්වල මිල අඩු වූ හෙයින් බොහෝ කර්මාන්ත ද ස්ථානගත විය. ඒ සමඟ ම රැකියා සඳහා ග්‍රාමීය ප්‍රදේශවලින් ජනතාව විශාල වශයෙන් පැමිණියහ. උපනගර වර්ධනය මෙන් ම නගරය වටා පිහිටි රබර් වතු හා පොල් වතු කැබලි කර විකිණීම මඟින් රබර්, පොල් වතුවල ප්‍රමාණය අඩු වූ අතර ඒ වෙනුවට කුඩා ගෙවතු සහිත නිවාස වැඩි වශයෙන් ව්‍යාප්ත විය. මෙලෙස නගර වටා උපනගර වර්ධනය වීමත් සමඟ නගරයට වඩා වේගවත් ව උපනගරවල ජන සංඛ්‍යාව වැඩි විය. එහෙයින් උපනගරවල ද තට්ටු නිවාස ඉදි වීමත්, උපනගර පිටතට වර්ධනය වීමත් දක්නට ඇත.

උපනගරවල නාගරික ලක්ෂණ වර්ධනය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ වටා පිහිටි ග්‍රාමීය ප්‍රදේශවල ද වෙනස් වීම් සිදු විය. මාර්ග රටාවන් දියුණු වීමෙන් නගරයට එළඹීමේ පහසුකම් ඇති වීමත් සමඟ මුල් කාලයේ ග්‍රාමීය ප්‍රදේශවල තිබූ හුදකලා බව මැකී ගියේ ය.

ක්‍රමයෙන් ජීවිතයේ අවශ්‍යතා සංකීර්ණ වන විට මුල් කාලයේ ගම්මානවල තිබූ ස්වයංපෝෂිත ආර්ථික රටාව ගිලිහිණි. එමෙන් ම මුල් කාලයේ පිදුරු, මැටි, පොල් අතු ආදී අමුද්‍රව්‍ය භාවිත කරමින් ඉදි කළ නිවාස වෙනුවට ස්ථිර නිවාස ඉදි කෙරිණි. මෙතෙක් ග්‍රාමීය ව බහුල වශයෙන් කළ කෘෂිකර්මය, සතුන් ඇති කිරීම වැනි කටයුතු අඩු වී රසකැවිලි නිෂ්පාදනය, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය, බිම්මල් වගාව, ඇඳුම් මැසීම වැනි බොහෝ ස්වයං රැකියා ආරම්භ විය. එමෙන් ම උප නගර හා නගරවල රැකියා සඳහා ගම්වල පිරිස් ඇදී යාමත් සිදු විය. ග්‍රාමීය ප්‍රදේශවල තරුණ පිරිස් ක්‍රමයෙන් කෘෂිකාර්මික කටයුතුවලින් ඈත් වීමේ ප්‍රවණතාවයක් ඇති වී තිබේ.



6.8 රූපය : වතු කම්කරුවන් සඳහා ඉදි කර ඇති නව නිවාස

මුල් කාලයේ කෘෂිකාර්මික කටයුතුවල දී වී ගොවිතැනට වැදගත් තැනක් හිමි වූ අතර පවුලේ පරිභෝජනය උදෙසා වී ගොවිතැන සිදු කිරීම විශේෂත්වයක් විය. නමුත් පසුකාලයේ දී කෘෂිකාර්මික නිෂ්පාදන පවුලේ පරිභෝජනයට පමණක් නොව වෙළෙඳාම පිණිස ද යොදවනු ලැබී ය. නගරයේ වෙළෙඳපොළවලට අවශ්‍ය එළවළු, පලතුරු, පලා වර්ග, ග්‍රාමීය ප්‍රදේශවලින් සැපයිණි. මෙලෙස ග්‍රාමීය කෘෂිකර්මය ද වාණිජකරණයට

හසු විය. ග්‍රාමීය ප්‍රදේශවල අවශ්‍යතා සපයා ගැනීමට ග්‍රාමීය ව කුඩා වෙළෙඳසල් ඇති වූ අතර නගරයේ හා උප නගරවල වෙළෙඳ කටයුතු ද වැඩි දියුණු විය.

ග්‍රාමීය ප්‍රදේශවල විදුලි බලය, මං මාවත්, ග්‍රාමීය බැංකු, දුරකථන ආදී යටිතල පහසුකම් සපයා දීමට මෑතක සිට විශේෂ උනන්දුවක් දක්වා ඇත. ශ්‍රී ලංකාවේ තේ, පොල්, රබර්, වතු ආශ්‍රිත ව රැකියාවල යෙදී සිටින බහුතර ද්‍රවිඩ කම්කරුවන් සඳහා එක ම පේළියට විහිදුණු තනි කාමර නිවාස වෙනුවට තනි නිවාස ඒකක ඉදි කර දීමට ද රජය කටයුතු කර දී තිබේ. ඔවුන්ගේ සමාජ, ආර්ථික, සංස්කෘතික ගැටලු විසඳීම මෙහි අරමුණ වේ.

**ක්‍රියාකාරකම්**

1. නගරයක තට්ටු නිවාස ඇති වීමට මුල් වන කරුණු දෙකක් පැහැදිලි කරන්න.
2. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනාවාසවල මෑතක දී ඇති වූ වෙනස්කම් පහක් ලියන්න.
3. ගැමිරික ජනාවාස යන්න හඳුන්වා, ගැමිරික ජනාවාස වර්ධනය වීමට බලපා ඇති හේතු පැහැදිලි කරන්න.